# මහනුවර යුගයේ රජු හා බැඳුණු ප්‍රභූ ආරක්ෂක නිලධාරින් සහ ඔවුන්ගේ කාර්යභාරය

එච්. එම්. ඉසුරු හේරත්

## හැඳින්වීම

ක්‍රි.පූ. 4 සහශ්‍රකයේ පුරාතන ලෝකයේ මානව ශිෂ්ටාචාර බිහිවූ දා සිට වර්තමානය දක්වා වූ දීර්ඝ කාලපරිච්ඡේදය තුළ ඔවුන්ගේ පවුල්වල උදවිය, ඥාතිවරුන් සහ සෙසු වැදගත් ප්‍රභූවරු ආරක්ෂා කර ගැනීම සඳහා ඒ ඒ රටවල ආරක්ෂක විශේෂඥවරු විවිධාකාර ප්‍රභූ ආරක්ෂක සේවාවක් ක්‍රියාත්මක කළහ. විශේෂයෙන් ම බාහිර හෝ අභ්‍යන්තර රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ, සතුරු ආක්‍රමණවලින් එල්ල වන අභියෝග, ප්‍රභූවරු දේශ සංචාරය කරන විට ආරක්ෂාව ලබා දීම හෝ විවේක අවස්ථාවල දී පාලකවරුන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුහු විවිධාකාර ප්‍රභූ ආරක්ෂක ක්‍රමවේද භාවිත කළහ. පුරාතන ලෝකයේ එ වැනි පාලකයා හා බැඳුණු ප්‍රභූ ආරක්ෂක සේවා අතර පර්සියානු අධිරාජවරුන් ආරක්ෂා කළ ඉම්මෝර්ටල්ස් (Immortals) නම් ප්‍රබල යුධකාමීන්, ග්‍රීක පෞර රාජ්‍යවල ප්‍රභූවරුන් ආරක්ෂා කළ හොප්ලයිට් (Hoplite) නම් රණකාමින්, ජපාන ප්‍රභූවරුන් ආරක්ෂා කළ සමුරායිවරුන් (Samurai), රුසියාවේ සාර් රජවරුන් ආරක්ෂා කළ කොසැක්වරුන් (Cossacks), රෝම අධිරාජ්‍යවරුන් ආරක්ෂා කළ ප්‍රොටෝරියන් ආරක්ෂකවරුන් (Praetorians), පුරාතන ඉන්දියාවේ රජවරුන් ආරක්ෂා කළ ශක්තිමත් රණකාමී කාන්තා ප්‍රභූ ආරක්ෂකයන් සහ චීනයේ අධිරජවරුන් ආරක්ෂා කළ නපුංසක හෙවත් පණ්ඩක සේනාවන් සිහියට නැගෙයි. පුරාතන සහ මධ්‍යකාලීන ලංකාවේ ද රජු හා බැඳුණු මෙයික්කාප්පර්,කුඩසලා වැනි ප්‍රභූ ආරක්ෂක සංවිධානයක් පැවති බවට අල්ප වූ සාධක හමුවෙයි. එහෙත් මහනුවර යුගය වන විට කිසියම් සංවිධානාත්මක ප්‍රභූ ආරක්ෂක සේවයක් පැවති බවට තොරතුරු අපමණ ය. විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි වැනි නවීන යුධ ශක්තියෙන් අනූන වූ යුරෝපීය ආක්‍රමණිකයන්ගෙන් එල්ල වූ අනේක විධ ආක්‍රමණවලට මුහුණදෙමින්, ලක්ෂ අට හමාරක උඩරට ජනතාවගේ ජීවත් වීමේ අයිතිය තහවුරු කළ මහ රජතුමා ආරක්ෂා කර ගැනීම සඳහා එතුමා හා බැඳුණු විශේෂ ප්‍රභූ ආරක්ෂක ක්‍රමෝපායන් සහ නිලධාරින් සිටි බවට සාධක ඇත.

## අරමුණ සහ ක්‍රමවේදය

උක්ත පර්යේෂණයේ අරමුණ වන්නේ මහනුවර යුගයේ මහරජතුමා ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළ ප්‍රභූ ආරක්ෂක නිලධාරීන් සහ ඔවුන්ගේ කාර්යභාරය කවරේ ද යන්න පරීක්ෂා කිරීම ය. පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස් කිරීමේ දී පුස්තකාලය ගවේෂණ ක්‍රමය (Library Survey) භාවිත කෙරිණ. එසේ ම මෙම අධ්‍යයනයේ දී මහනුවර යුගයේ ආරක්ෂක සංවිධානයට අදාළ ව පර්යේෂණ පැවැත් වූ උගතුන්ගේ වාර්තා බහුල වශයෙන් භාවිත කළ අතර පසු ව ඒවා විශ්ලේෂණය කොට නිගමනය කරා එළැඹිණි. මෙහි දී පර්යේෂකයාගේ පර්යේෂණ ද මහත් රුකුලක් විය.

## සාකච්ඡාව

විශේෂයෙන් ම රාජකීය භෝජනාගාරයෙත්, සයනාගාරයෙත්, රජමාළිගාවෙත්, යුධ පිටියේදීත්, නාන ස්ථානයේදීත් සහ රාජකීය සංචාරවලදීත් රජු සිටින විට පොදුවේ ඔහුව දිවි හිමියෙන් ආරක්ෂා කිරීමට ආරක්ෂක නිලධාරිහු බැඳී සිටියහ. උක්ත වගකීම සඳහා අවශ්‍ය වන නිලධාරීන් වශයෙන් බඳවා ගනු ලැබුවේ රජුට වඩාත් පක්ෂපාත ප්‍රදේශවලට අයත් රණකාමී සෙබලුන් සහ ජා, මැලේ, නිග්‍රෝ (කාපිරි), තංජෝර්, මලබාර්, රාජපුත්‍ර, අරාබි යනාදි පෙරදිග ජනවර්ගවලට අයත් විදේශීය කුලී සෙබලුන් ය. එසේ ම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි, ඩැනිෂ්, ප්‍රංශ යන අපරදිග ජනවර්ගවලට අයත් කුලී සෙබළු මෙන් ම නිලධාරීහු ද කලාතුරකින් ද උඩරට රාජකීය ප්‍රභූ ආරක්ෂක භට හමුදාවල රාජකාරි කළහ.

ප්‍රථමයෙන් ම මහනුවර යුගයේ රාජකීය මුලුතැන්ගෙය හා බැඳුණු ප්‍රභූ ආරක්ෂක සේවය ඉතා සංකීර්ණ සොබාවයක් ගත් බව පෙනෙයි.[1] පාක ශාලාව, මඩෙප්පල්ලියේ යන නමින් ද හඳුන්වන මෙහි ප්‍රධානියා වූයේ, අතීතයේ මුලගිනාවෝ නමින් ද හඳුන්වන මුලුතැන්රාල හෙවත් මඩප්පු නිලමේ ය.[2] මොහු යටතේ මඩප්පුරාලලා සහ මුලුතැන් රාලලා විසින් මුකවාඩම් බැඳ ආහාර පිළියෙල කොට නියමිත ස්ථානය හෙවත් රාජකීය භෝජනාගාරයේ රජුට අනුභව පිණිස තැන්පත් කරවන ලදි. එහෙත් රජු අනුභව කිරීමට පෙර එම කෑමවල වස විස තිබේදැයි පරීක්ෂා කළ නිලධාරියා වූයේ අගු බලන්නා ය. අගුබලන රාල, අගුබලන නිලමේ, අගුබලන මුහන්දිරම් යනුවෙන් ද හඳුන්වන මොහු අලුතින් පිසින ලද ආහාර මුලින් ම අනුභවකොට ටික වෙලාවක් හාන්සි වී සිටියි. පසු ව අනතුරක් නො වේ නම් රජුට භෝජනය පිණිස ආරාධනා කළේ අගුබලන්නා විසිනි. විමලකීර්ති හිමියන්ට අනුව ආගු ශබ්දය යන්නෙහි තේරුම වන්නේ රජුට ලබාදෙන අග්‍ර භෝජනයෙහි වරද නිවරද යන්න බලන්නා බව යි.[3] මීට වෙනස් මතයක් දරන අභයසිංහ පෙන්වා දෙන්නේ අගු බලන්නා යන නමින් හැඳින්වෙන්නේ රාජකීය අග්‍ර භෝජනයේ රස විමසා බලන්නා යන්න බව යි.[4]

තවද රජතුමා සැතපෙන හෝ විවේක ගන්නා අවස්ථාවල භාවිත කළ සැතපෙන ගේ හෙවත් සිරියහන් ගබඩාවේ ආරක්ෂාවට, ඒ ආසන්න ව සැතපෙන

ගෙයි අප්පුලා නම් කුලීන නිලධාරීහු පිරිසක් සේවය කළහ. උසස් රදළ කුලවලින් බඳවාගත් රණශූර තරුණයන්ගෙන් සමන්විත මෙම හමුදා ඒකකයේ ප්‍රධානියා වූයේ මහ සැතපෙන ගෙයි මුහන්දිරම් නිලමේ නැමැත්තා ය. මොහු යටතේ පෙර සඳහන් කළ අප්පුලා හෙවත් අප්පුහාමිවරු නම් කුලීන තරුණයෝ සේවය කළහ. ලේකම්වරයෙක්, කංකානම් නිලමේවරයෙකුගේ ද සහාය මේ සඳහා ලැබිණ.[5] රජතුමා දෛනික ව පළඳින ආභරණ වර්ග ආරක්ෂා කිරීම ලේකම්වරයාගේ රාජකාරිය වූ අතර දෛනික ව රජතුමා ආරක්ෂා කරන අප්පුහාමි බළඇණියේ අණදෙන නිලධාරියා වශයෙන් කංකානම් නිලමේවරයා කටයුතු කළේ ය. සැතපෙන ගෙයි මුරපොළ ඔවුන්ගේ බල කුටිය විය. රාජාධි රාජසිංහ රජු කළ මෙහි 112 දෙනෙකු සේවය කළ අතර, අවසාන රජු එය 48 දක්වා අඩු කළ බව ඩොයිලි සඳහන් කරයි මොවුන් පිළිබඳ ව ඩොයිලි තවදුරටත් මෙසේ සඳහන් කරයි.[6]

"...අවසර ලබගෙන තම ගම්වලට යන්නන් හැර ඔවුන්... මහනුවර නැවතී සිටීමට අපේක්ෂිතයි. සැතපෙන ගේ බරාදියට....මොවුන්ගෙනුදු... 12 දෙනෙක් පමණ ඉලුක්කෝල (... වැනි හෙල්ල) ගෙන යති. මේ ආයුධ රන් ආවුදගේ තබා ඇත. මෙවිට මුබවාඩන් හෙවත්... තොල් මත අඟලක් පමණ පළල සුදු රෙදි බඳින් මුල දී මුබවාඩම් පළලින් අඟල් 2 ක් පමණ විය. එහි මුබය වැසුණු කොටස පච්ච වඩන් වූ අතර සෙස්ස සුදු රෙදි විය (සිංහලේ ආණ්ඩුක්‍රමය..."[7]

රජු ස්නානය කරන විට ඔහුව නාවා පිරිසිදු කිරීමටත් ආරක්ෂා කිරීමටත් දියවඩන නිලමෙවරයා යටතේ සට්ටම්බිවරු නම් නිලධාරීහු පිරිසක් සේවය කළහ. මීට අමතර ව උඩරට රජතුමාත්, ඔහුගේ පවුලේ උදවියත්, රජමාළිගාවත් ආරක්ෂා කරන රජුගේ ආරක්ෂක හමුදාව හෙවත් රාජකීය ආරක්ෂක හමුදාව අතපත්තුව නම් විය. දෙමළ භාෂාවට අනුව ආත්තු පාත්තුප් යන ශබ්දයෙන් අතපත්තු නාමය සිංහලයට පැමිණ තිබේ. එහි තේරුම වන්නේ රැක බලා ගන්නා යන්න යි.[8] රජු ඇතුළු රජ පවුලේ අයවලුන් සුරක්ෂිත කළා පමණක් නො ව, රාජද්‍රෝහීන් අල්ලා ගැනීම, ස්වකීය බල ඇණියේ සෙබළුන්ගේ විනය පවත්වාගෙන යාම අතපත්තු හමුදාවේ අණ දෙන්නා වන අතපත්තු මුහන්දිරම් නිලධාරියාගේ ප්‍රධාන කාර්ය විය.[9] මොහුට යුද්ධ හමුදාව මෙහෙයවීමට ද බලයක් තිබූ බව පෙනෙන්නේ ක්‍රි.ව. 1624 සෙනරත් රජු විසින් යාපනය අල්ලා ගැනීම සඳහා 3000 සේනාවක් සමඟ අතපත්තු මුහන්දිරම්වරයා අණදෙන්නා ලෙස යැවීමෙනි. අතපත්තු මුහන්දිරම් නිලමේවරයාගේ අණදීම යටතේ කන්කානම්වරු දෙදෙනෙකුත් අතපත්තු අප්පුහාමිලා හෙවත් කුලීන සෙබලු 50 - 60 අතර පිරිසක් රජ මාළිගාව අසල අතපත්තු මුරපොළේ සිට රජ පවුල ආරක්ෂා කළහ. එහෙත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ එහි ප්‍රමාණය 48 දක්වා අඩු කළහ. මේ සඳහා බඳවා ගනු ලැබුවේ සතර කෝරළය, සත් කෝරළය, උඩුනුවර සහ යටිනුවර යන ප්‍රදේශවල රාජපාක්ෂික රණකාමී අයවලුන් ය. අත්තපත්තුවරුන් පිළිබඳ ජෝන් ඩොයිලි මෙසේ පෙන්වා දෙයි.

...මුල දී අතපත්තු අප්පුහාමිලා 50 - 60 සිටියෝ ය. නමුත් අවසන් රජු විසින් එය 48 ට.... සතර කෝරළේ, සත් කෝරළේ, උඩුනුවර යටිනුවර අය.

රෝගී විට විනා.... ඔවුන් නොකඩවා මහනුවර රාජකාරි යෙදී සිටිය යුතු යි අපේක්ෂා කරනු ලැබේ. අන්‍ය අවස්ථාවල දී ඔවුහු නිවාඩු ලබාගෙන තම ගම්වලට යති. සේවය සඳහා නැවතී සිටින සංඛ්‍යාව 15 - 30 ට වැඩි නො වේ.

මේ ගණනින් අඩක් මාරුවෙන් මාරුවට හැම රැයක ම මුරපළේ නිදා ගනිති.... දෙදෙනෙක් නිරතුරු මුර කරති. දවාලේ දෙතුන් දෙනෙකුට වඩා නොසිටිත්...."

රජු බැහැර යන විට මහනුවර සිටින අපත්තුවේ හැමදෙනම රජු පිරිවරා සිටිති. මෙයින් 10 හෝ 12 දෙනෙක්.... අඩි හත, අටක් උස් පළල් තල ඇති සුසේ ගෙන යති. අනෙක් අඩ ඔවුන්ගේ තැන ගනිත්. සුසේ සහ අන් ආයුධ සියල්ලම රන් ආවුද මණ්ඩපයේ තැන්පත් කර තිබේ.[10]

රජු හා ඔහුගේ පවුලේ උදවිය ආරක්ෂා කළ මහා අතපත්තු සේනාවට අමතර ව දිශාවේවරයා සහ ඔහුගේ පවුලේ ප්‍රභූවරුන් ආරක්ෂා කළ පිරිස දිශා අතපත්තු නම් විය. රජු හෝ දිසාවේවරයා ආරක්ෂා කිරීම, නීතිය ක්‍රියාත්මක කිරීම, පණිවිඩ ගෙන යාම, ප්‍රභූවරුන් සමඟ පෙරහැරේ යාම, රජතුමාගේ ස්වර්ණමය සන්නාහය ගෙන යාම, ඔවුන්ට අයත් අනෙක් කාර්යන් අතර විය.[11] රජුගේ මාළිගාව සහ අගනුවර ආරක්ෂක හමුදාව භාර වූයේ මඩුවේ කාර්යාංශයට ය. එහි ප්‍රධානියා වූයේ මඩුවේ ලේකම්වරයා ය. හෙතෙම රජ මාළිගාව අගනුවර වටා තිබූ මුරපොළවල සිටි තුවක්කු රැගත් සෙබළුන්ගේ අණදෙන්නා විය. බොහෝ විට මොහු රජතුමා, අදිකාරම්වරුන් දෙදෙනාගේ අධීක්ෂණය යටතේ අගනුවර ආරක්ෂාව මෙහෙය වූ බව පෙනෙයි. විශේෂයෙන් ම රජු පෞද්ගලික ව ම සතුරාට එරෙහි ව සේනාව මෙහෙයවන විට ඊතල, තෝමර, හෙලි, තුවක්කු ප්‍රහාරවලින් රජු ආරක්ෂා කළ නිලධාරියා වූයේ පලිහවඩන නිලමේ ය.[12] තවද ගිලන් වූ අවස්ථාවල රජතුමාට උපස්ථාන කිරීමටත්, ඇතැම් යුදමය වශයෙන් අනතුරුදායක අවස්ථාවල දී සතුරා නොමඟ යවා රජු ආරක්ෂා කිරීම සඳහා දුක්ගන්නා රාල නම් නිලධාරීන් පිරිසක් සේවය කළහ. නිදසුන් ලෙස ක්‍රි.ව. 1664 දී II වන රාජසිංහ රජතුමාට එරෙහි ව අඹන්වල රාල විසින් මෙහෙයවන ලද "සුප්‍රකට නිල්ලඹේ කැරැල්ලේ දී, රජු පලා යාම සලස්වා පසු ව සිරි යහන් ගබඩාවේ සැතපී සිට, කැරලිකරුවන් අතින් ඝාතනයට ලක් වූ අළු විහාරේ වනිගසේකර නම් දුග්ගන්නාරාලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මූලික ව ම රජුට බෙහෙවින් ම පක්ෂපාති කුලීන පවුල්වල තරුණයන් මේ සඳහා බඳවා ගැනිණ. මොවුන් රැඳී සිටි මුරපොළවල් ගණන 14කි. මොවුන් පිළිබඳ ව ජෝන් ඩොයිලි මෙසේ වාර්තා කරයි.

"....කුණ්ඩසාලේ රජු සමයෙහි රජතුමා මේ දුග්ගන්නා රාලලා ද අනෙක් රජුගේ සේවයේ නියුතු පුද්ගලයන් මෙන් වරකට මසක් හෝ නියමිත කාලපරිච්ඡේදයක් හෝ බැගින් මාරුවෙන් මාරුවට මුර සඳහා යෝග්‍යයයි පළ කළේ ය. එහෙත්...... ඔවුන් අනෙක් පන්ති හා සමකොට සැලකීම නින්දාවකැයි රජුට නිරතුරු සාත්තු සප්පායම් කිරීම දුග්ගන්නාරාලලාගේ යුතුකම යැයි ද ඔවුන්ට.... ගම්වලට යාම අවශ්‍ය හදිසියක් වුවහොත් නිවාඩු ඉල්ලිය හැකි යැයි ද පවසා යටකී අනුග්‍රහය ආචාර සම්පන්න ලෙස ප්‍රතික්ෂේප කළෝය. [13]"

රජු හා රජ කුමාරවරු ආරක්ෂා කළ දුක්ගන්නාරාලාට අමතර ව රාජකීය ස්ත්‍රී පාර්ශ්වය ආරක්ෂා කිරීම සඳහා දුග්ගන්නා උන්නාන්සේලා නම් කාන්තා ආරක්ෂකයන් පිරිසක් මහනුවර රජ වාසලේ සිටියහ. විශේෂයෙන් ම මොවුන්ට රජුගේ යකඩ දොලි නම් පරිවාර බිසෝවරුන් මීට අයත් වූ බව පෙනේ. ඇතැම් විට සෘජු ව සැනසවීමටත් මොවුහු ක්‍රියා කළහ. බොහෝ විට අප්‍රධාන පවුල්වලින් බිහි වූ රාජකීය බිසෝවරුන්ට ද මේ තනතුර දුන් බවට සාධක ඇත.[14] මීට අමතර ව ප්‍රධාන සහ අප්‍රධාන බිසෝවරුන් සහ ඔවුන්ගේ කුමාරවරුන් ආරක්ෂා කිරීමටත්, උවටැන් කිරීමටත් දුග්ගන්නා මහත්තිලා සහ කිරිමහත්තිලා නම් කුලීන සේවිකාවන් පිරිසකුත් රජවාසල සේවය කළහ. තවද රාජ්‍ය ද්‍රෝහීන් අල්ලා ගැනීම, රජු මැරවීමේ කුමන්ත්‍රණ, රජුට එරෙහි සතුරු ආක්‍රමණ වැළැක්වීම සඳහා රජුගේ උපදෙස් පරිදි ඉතා රහසිගත ඔත්තු සේවයක් ක්‍රියාත්මක විය. එහි ප්‍රධානියා වූයේ නානායක්කාර ලේකම් ය. නිදසුන් ලෙස ක්‍රි.ව. 1761 කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඇතුළු රජ පවුලේ පිරිස මල්වතු විහාරයේ බණ මඩුවේ හැරූ බොරු වළක බහා මැරවීමේ කුමන්ත්‍රණය, II රාජසිංහට එරෙහි ව නිල්ලඹේ කැරැල්ල අසාර්ථක වූයේ ද උසස් දියුණු ඔත්තු සේවා හේතුවෙනි[15]. මෙම ඔත්තු සේවාව උඩරට රාජධානිය පුරා පමණක් නො ව රජ මාළිග ාවේ ද තදින් ක්‍රියාත්මක වූ බවට සාධක ඇත. II රාජසිංහ රජ සමයේ උඩරට ඔත්තු සේවය එ ලෙස රජ මැදුර තුළ ක්‍රියාත්මක වූ ආකාරය රොබට් නොක්ස් මෙසේ පෙන්වා දෙයි.

"...රාත්‍රී කාලයේ මාලිගය මුර කිරීම පිණිස මිනිසුන් මතු නො ව අලි ඇතුන් ද යොදවති. කිසියම් කලකෝලාහලයක් ඇති වුවහොත් මෙම ඇතුන් ලබා සියලුම විරුද්ධවාදීන්, කලහකාරීන් පාගවාලන්නට පුළුවන් වන්නේය. මේ හැර රාජභවනයෙහි නිග්‍රෝ ජාතික මුරකරුවෝ ද වෙති. ඔවුන්ට ලංකාවේම මුරකරුවන්ට වඩා විශේෂ ලෙස පාරිතෝෂ දෙනු ලැබෙයි. මේ නිග්‍රෝ ජාතික මුරකරුවෝ මහරජුගේ ශරීරාරක්ෂකයෝ වෙති. සමහර අවස්ථාවලදී මුරකරුවෝ හරිහැටි මුරකාවලෙහි යොදන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා රජතුමා චරපුරුෂයින් යොදවති. එක් දවසක් අභාග්‍යයකට මෙන් මෙම නිග්‍රෝ මුරකරුවෙකුට නින්ද ගොස් තිබිණි. රජුගේ චරපුරුෂයා පැමිණ මෙම නිදිගත් ආරක්ෂක නිලධාරියාගේ කඩුපත හා ඔහුගේ හිස්වැස්ම රජු වෙත ගියේය. මහරජතුමා ඔහු කැඳවා වගතුග අසා ප්‍රථම වරට සමාව දී ඔහුට ඔවදන් දී නිදහස් කර හැරියේය. මෙම චරපුරුෂයන් සතු රාජකාරිය මුරකරුවන් නිදි අවදිව සිටින නොසිටින බව බැලීම පමණක් නො වේ. මුරකරුවන් කථා කරන දේ ද අසා සිටියි. ඒ පිළිබඳ ව මහ රජුට සැල කිරීම ඔවුන් සතු යුතුකමක් වන්නේය..."[16]

## නිගමනය

පෙර දක්වන ලද කරුණුවලට අනුව පෙනී යන්නේ උඩරට රජතුමාත්, ඔහුගේ පවුලේ උදවියත් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ප්‍රභූ ආරක්ෂක සේවයක් පැවති බව යි. එය රජු හා බැඳුණු රාජකීය භෝජනාගාරයේත්, සයනාගාරයේත්, රජ මාළිගාවේත්, නාන ස්ථානයේදීත් රාජකීය සංචාරවල දී ද යුද්ධ පිටියේ දී ද, එකී ප්‍රභූ ආරක්ෂක

සේවය ක්‍රමානුකූල ව සිදු වූ බවට සාධක හඳුනාගත හැකි ය. විශේෂයෙන් ඒ සඳහා මනා සංවිධානයක් සහිත බළ ඇණි, පෞද්ගලික ආරක්ෂකයන් පමණක් නො ව, ඔත්තු සේවයක් ක්‍රියාත්මක වූ බවට සාධක මෙම ලිපියෙන් ඔප්පු වෙයි. මෙම තොරතුරුවලට අනුව බටහිර යුධෝපක්‍රම රඟත් වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රභූ ආරක්ෂක සේවයට නොදෙවෙනි, රජු හා බැඳුණු ප්‍රභූ ආරක්ෂක සේවයක් මහනුවර යුගයේ පැවති බවට නිගමනය කිරීම සාධාරණ ය.

## ආන්තික සටහන්

01. පී.ඇම්.ජී. **අභයසිංහ හා උඩරට විත්ති**, (කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2017), පිටු 66.
02. මැදඋයන්ගොඩ, විමලකීර්ති හිමි, **සිංහල ආණ්ඩුව**, (කොළඹ: අනුලා මුද්‍රණාලය 1942), පිටු 142
03. මැදඋයන්ගොඩ විමකීර්ති හිමි, **සිංහල ආණ්ඩුව**, පිටු 143.
04. පී.ඇම්.ජී. අභයසිංහ, **උඩරට විත්ති**, (කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2017) පිටු 67.
05. රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධාන** (කොළඹ: සමන් ප්‍රකාශකයෝ, 1964)පිටු 13.
06. **සිංහලේ ආණ්ඩුක්‍රමය**, සංස් ඇල්ලේපොල එම් සෝමරත්න, (කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1966), පිටු 148.
07. **සිංහලේ ආණ්ඩුක්‍රමය**, සංස්. ඇල්ලේපොල එම් සෝමරත්න, පිටු 148.
08. පී.ඇම්.ජී. අභයසිංහ, **උඩරට විත්ති**, (කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ 2017), පිටු 54.
09. ඉසුරු හේරත් **කන්ද උඩරටගරිල්ලා යුධෝපක්‍රම**, (ජාඇළ: සමන්ති ප්‍රකාශකයෝ, 2016), පිටු 58.
10. **සිංහලේ ආණ්ඩුක්‍රමය**, සංස්. ඇල්ලේපොල එම්. සෝමරත්න, (කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1966), පිටු 147.
11. රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**, (කොළඹ: සමන් ප්‍රකාශනයෝ, 1964ෆ, පිටු 13.
12. ජී.ඇස්. ගමගේ, **මහනුවර යුගයේ රාජ්‍ය ආරක්‍ෂක ක්‍රමෝපාය.** (කොළඹ: අස් ගොඩගේ සහ සහෝදරයෝ, 1997), පිටු 35.
13. **සිංහලේ ආණ්ඩුක්‍රමය**, සංස්. ඇල්ලේපොල එම් සෝමරත්න, (කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1960), පිටු 147.
14. මැදඋයන්ගොඩ, විමලකීර්ති හිමි, **සිංහල ආණ්ඩුව**, (කොළඹ: අනුලා මුද්‍රණාලය, 1942), පිටු 150.
15. ඉසුරු හේරත්, **කන්ද උඩරට ගරිල්ලා යුධෝපක්‍රම**, (ජා ඇළ සමන්ත ප්‍රකාශකයෝ: 1966), පිටු 71.
16. **එදා හෙළදිව**, පරි.ඩේවිඩ් කරුණාරත්න (කොළඹ: ඇම්.ඩී. ගුණසේන සමාගම:1992), පිටු 129.
17. Siriweera,W.I,Silva Sanath,2017,**Warfare in Sri Lanka**, Colombo, Sarasavi publishers.

## ඡායාරූප නාමාවලිය



රුසියානු රජවරුන්ගේ කොසැක් ප්‍රභූ ආරක්ෂකයෝ
(**www.Wikipedia.com)**



ජපාන සමුරායි ප්‍රභූ ආරක්ෂකයෝ
(www.Wikipedia.com)



රෝම ප්‍රෙටෝරියන් ප්‍රභූ ආරක්ෂකයෝ
**(www.Wikipedia.com)**



ග්‍රීක හොප්ලයිට් ප්‍රභූ ආරක්ෂකයෝ
**(www.Wikipedia.com)**



ඉම්මෝර්ට්ලස් නම් පර්සියානු ප්‍රභූ ආරක්ෂකවරු
(**www.Wikipedia.com)**



ඉන්දියානු කාන්තා ප්‍රභූ ආරක්ෂකවරු
**(www.shunya.com)**




උඩරට රජුගේ ප්‍රභූ ආරක්ෂකයෝ
**(ප්‍රසන්න වීරක්කොඩිගේ සිතුවමකි)**